**ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල - 2021**

------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් විධිමත් ප්‍රතිපාදන සලසා ගැනීමකින් තොරව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කර රු.47,472,450,000 ක් අරමුදලට ලබා දී තිබුණු අතර, එය මූල්‍ය ප්‍රකාශනවල වගකීම් ලෙස වර්ගීකරණය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.26,673,196,758 ක මූල්‍ය බැරකම් තවදුරටත් පැවති අතර, 2022 ජූනි 15 දින වන විට ඉන් රු.1,107,478,000 ක් නිදහස් කර තිබුණි. ඉතිරි බැරකම් නිදහස් කිරීමට අරමුදලට ප්‍රමාණවත් මුදල් නොතිබුණි. මේ හේතුවෙන් අරමුදලෙහි නුබුන්වත් බව පිළිබඳව ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවයක් පවතින බව නිරීක්ෂණය විය. | ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල සම්බන්ධව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අනුව කටයුතු කරනු ලැබේ. | විධිමත් අනුමැතියක් මත මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වගකීම් සම්බන්ධයෙන් ඉදිරි පියවර ගතයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 අප්‍රේල් 02 දිනැති අංක 20/0684/204/060 දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා ඊට අදාළ සමාංක හා 2020 මාර්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ 02 ඡේදය ප්‍රකාරව , උක්ත අරමුදල කළමනාකරණය සඳහා කමිටුවක් පත් කළ යුතු වුවද, එම කළමනාකරණ කමිටුවේ නිලධාරීන් වෙත නිකුත් කළ පත්වීම් ලිපි හා ඊට ලබාදුන් නියෝග පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | MFE/ERD/17/CM/2020/072 අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව අරමුදලෙහි කළමනාකරණ කටයුතු සඳහා සාමාජිකයින් පස් දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත්කර ඇත.<br>ඒ අනුව අදාළ තනතුරුවලට පත්ව ඇති නිලධාරීන් මෙම කමිටුවේ සාමාජිකයන් ලෙස කටයුතුකරනු ලබයි. | විධිමත්ව පත්වීම් සිදු කිරීම හා නියෝග නිකුත් කිරීම සිදු කළ යුතු වීම. |
| (ඇ) | මිල ස්ථායීකරණ අරමුදලක් ඇති කිරීමේ අපේක්ෂිත අරමුණ වනුයේ මිල වැඩිවීමේදී හා අඩුවීමේදී සිදුවන මිල උච්චාවචනයන් පාලනය කර ස්ථාවර මිලක් පවත්වා ගැනීම වේ. ලෝක වෙළඳපොලේ ඉන්ධන මිල අඩු වී තිබියදීත් ආනයනයේදී අධිභාරයන් අයකර පැවති මිලටම ඉන්ධන අලෙවි කිරීම හේතුවෙන් 2020 මාර්තු මාසයේ සිට 2021 ජනවාරි මාසය දක්වා කාලය තුළ ඉන්ධන ස්ථායීකරණ අරමුදල රු.22,434,531,371 ක සමුච්චිත ශුද්ධ අතිරික්තයක් උපයාගෙන තිබුණි. එම අතිරික්තය ලෝක වෙළඳපොලේ ඉන්ධන මිල වැඩිවීමකදී දේශීය මිල ස්ථායිව පවත්වා ගෙන යෑම සඳහා ද්‍රවශීල වත්කමක් ලෙස පවත්වාගෙන යා හැකිව තිබුණද, අමාත්‍ය මණ්ඩල තීරණයේ ඒ බව සඳහන් කර නොතිබුණු අතර එහි වූ අනුමැතිය පරිදිම අරමුදලේ රුපියල් බිලියන 48 ක මුදල් විදුලිබල මණ්ඩලය වෙත ප්‍රාග්ධන දායකත්වයක් ලෙස 2020 වර්ෂයේදී ලබාදී එය 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ද ආයෝජන යටතේ දක්වා තිබුණි . | ඛණිජතෙල් සංස්ථාවේ මූල්‍ය තත්ත්වය යහපත් කර ඉන්ධන මිල ඉහළ යාම පාලනය කිරීම ප්‍රධාන අරමුණ විය. ඒ අනුව, 2020 වර්ෂය තුළ හා 2021 ජනවාරි මාසයේ මුල් කාල සීමාව තුළ අඛණ්ඩව ලෝක වෙළඳපළේ ඉන්ධන මිල ඉහළ යාම හමුවේ පසුගිය ඉන්ධන මිල සංශෝධනය දක්වා මිල ස්ථාවරව පවත්වා ගත හැකි විය. මෙම යාන්ත්‍රණය ඉන්ධන මිල පමණක් නොව විදුලි ගාස්තුවද ස්ථාවරව පවත්වා ගෙන යාමට හේතු වී ඇති බැවින් අරමුදල තම අරමුණෙන් බැහැර වී නොමැති බව අවධාරණය කරමි. | ලෝක වෙළඳපලේ මිල අඩුවීමේ වාසිය වඩාත් ඵලදායී අරමුණු වල යෙදවිය යුතු වීම. |

### 1.5.2 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලට අඛණ්ඩ පැවැත්මක් නොමැති බව කළමනාකාරීත්වය විසින් තීරණය කිරීම හේතුවෙන්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යටතේ විධිමත් ප්‍රතිපාදන සලසා ගැනීමකින් තොරව අරමුදල විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාග්ධන දායකත්වය වෙනුවෙන් ආයෝජනය කර තිබුණු රු.48,000,000,000 ක් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර තිබුණි. ප්‍රායෝගිකව එය වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසුව එළඹෙන මාස දොළහක කාලය තුළදී උපලබ්ධි කරන ආකාරය විගණනයට පැහැදිලි කර නොතිබුණි. | රාජ්‍ය අංශයේ ආයතනයකට එහි අඛණ්ඩ පැවැත්ම සඳහා අරමුදල් නොමැතිකම හෝ මහජනතාවට සපයනු ලබන සේවාවන්ට බලපාන ප්‍රතිපත්තිමය තීරණ රජය විසින් ගන්නා විට හෝ එහි අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් මතුවිය හැක. ඒ සඳහා, ඉදිරි වර්ෂ කිහිපය තුළ ලෝක වෙළඳපොළෙහි බොරතෙල් බැරලයක මිලෙහි පහළ යාමක් අපේක්ෂා කළ නොහැකි වීම, විදේශ විනිමය අනුපාතිකයන්ගේ යහපත් වෙනස් වීමක් පුරෝකථනය කළ නොහැකි වීම හා මෙම අරමුදලට විස්තීරණ ආදායම් ප්‍රභවයන් නොමැති අතර ඉන්ධන මිල මත පනවන ලද අධිභාරය එකම ආදායම් ප්‍රභවය වීම යන කරුණු ද හේතු වී ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම විධිමත්ව කළ යුතුවීම. |

### 1.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් කළ මු.රෙ. 876 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාවට පරිබාහිරව ආදායම් රැස් කිරීම හා වියදම් දැරීම පාර්ලිමේන්තුව අනුමත කර නොතිබුණත්, 2020 මාර්තු 18 දින සිට මෙම අරමුදල ආරම්භ කර තිබුණි. 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් කළ මු.රෙ. 876 ප්‍රකාරව ලබාගත යුතු පාර්ලිමේන්තු අනුමැතිය 2022 ජූලි 11 දින වන විටත් ලබාගෙන නොතිබුණි. | මෙම අරමුදල අහෝසි කිරීම සඳහා නිසි පරිදි අනුමැතිය ලබාගැනීමටත් එසේ ලබාගැනීමෙන් පසු එහි ගනුදෙනු හා වගකීම් පියවීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය විසින් භාරගැනීම, ඇවර කිරීම යනාදිය සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.728,619,209 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.21,705,911,662 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.20,977,292,453 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ශ්‍රී ලංකා රේගුවෙන් ලද අධිභාර ඉවත් කිරීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **අරමුදල ඇතිකිරීම හා පවත්වාගෙන යාම**<br><br>2020 මාර්තු 11 දින වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් භාණ්ඩාගාර ලේකම් මඟින් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කළ සටහනට අනුව, 2020 මාර්තු 09 දින වනවිට අන්තර්ජාතික වෙළඳපොලේ බොරතෙල් මිල සියයට 42.5 කින් අඩු වී ඇති බවත්, ඒ වනවිට බැරලයක වටිනාකම එ.ජ . ඩොලර් 34.63ක් පමණ වන බවත්, 2019 සැප්තැම්බර් මාසය වන විට එය එ.ජ .ඩොලර් 59.73ක් වන බවත් දන්වා තිබුණි.<br><br>මේ සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් කළ ගණනය කිරීම් අනුව, බොරතෙල් මිල පහළ යාම හේතුවෙන් ඉන්ධන ලීටරයක මිල පහත පරිදි පහළයාමක් බලාපොරොත්තු වී තිබුණි. | | |

| | මිල ගැලපුම (ලීටරයකට ආසන්න වශයෙන්)<br>රු. |
|---|---|
| පෙට්‍රල් 92 ඔක්ටේන් | 12 |
| පෙට්‍රල් 95 ඔක්ටේන් | 15 |
| ඔටෝ ඩීසල් | 14 |
| සුපිරි ඩීසල් | 20 |

මෙම මිල පහළයාමේ වාසිය, ලබාදී ඇති බදු සහන අයකර ගැනීමෙන් පසු මුළු ප්‍රතිපාදනයම මහජනතාවට ලබාදීම, බදු අයකිරීම ඉහළ නංවා මුළු ප්‍රතිලාභයම රජයේ ආදායමට ලබාගැනීම, ඉන්ධනවල සිල්ලර මිල පහත දැමීම හා ඉන්ධන මිලෙහි වෙනසක් නොකොට ඉන්ධන සැපයුම් ආයතන විසින් අවසාන මාස 05 තුළදී ලබා ඇති පාඩුව පූර්ණය කරගැනීම ලෙස විකල්ප 04 ක් යටතේ ඇගයීම් කර තිබුණි.

කෙසේ වෙතත්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සටහනේ (ආ) ඡේදය අනුව ඔටෝ ඩීසල් සඳහා රු.11 ක් ද, පෙට්‍රල් 95 ඔක්ටේන් සඳහා රු.15 ක් ද, සුපිරි ඩීසල් සඳහා රු.20 ක් ද වශයෙන් වූ මිල අඩුවීමේ ඉතිරිය සඳහා රේගු ආඥා පනත යටතේ අධිභාරයන් පැනවීම හෝ වෙළඳපොළ මිල අඩුකිරීම සඳහා මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයාගේ අනුමැතිය අපේක්ෂා කර තිබුණි.

ඒ අනුව, 2020 මාර්තු 13 දිනැති අංක 2166/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනය මඟින් පහත පරිදි ඉන්ධන හා සම්බන්ධ තීරු බද්ද සමඟ අයකළ යුතු අධිභාරය 2020 මාර්තු 14 දින සිට මාස 02 ක කාල සීමාවක් සඳහා බලපැවැත්වෙන පරිදි නියම කර තිබුණි.

| | අධිභාරය (ලීටරයකට) |
|---|---|
| | රු. |
| පෙට්‍රල් 92 ඔක්ටේන් | 0 |
| පෙට්‍රල් 95 ඔක්ටේන් | 15 |
| ඔටෝ ඩීසල් | 11 |
| සුපිරි ඩීසල් | 20 |

පසුව අන්තර්ජාතික වෙළඳපලේ බොරතෙල් මිල උච්චාවචනය වූ අවස්ථාවලදී පහත පරිදි අධිභාර වටිනාකම අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනය මඟින් සංශෝධනය කර තිබුණි .

| ගැසට් පත්‍රයේ අංකය | දිනය | පෙට්‍රල් 92 ඔක්ටේන් රු. | පෙට්‍රල් 95 ඔක්ටේන් රු. | ඔටෝ ඩීසල් රු. | සුපිරි ඩීසල් රු. |
|---|---|---|---|---|---|
| 2172/6 | 2020.04.22 | 26 | 49 | 24 | 40 |
| 2181/13 | 2020.06.24 | 0 | 20 | 12 | 30 |
| 2189/57 | 2020.08.23 | 0 | 20 | 12 | 30 |
| 2203/1 | 2020.11.23 | 0 | 20 | 12 | 30 |
| 2213/7 | 2021.02.01 | 0 | 0 | 0 | 0 |

2021 පෙබරවාරි 01 දිනැති අංක 2213/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කළ නිවේදනය මඟින් 2020 නොවැම්බර් 23 දිනැති අංක 2203/1 දරන ගැසට් පත්‍රයේ පල කරන ලද නිවේදනයේ සඳහන් ප්‍රකාශිත නියමය 2021 පෙබරවාරි 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර තිබුණි .

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (අ) | විදේශ වෙළඳපලේ ඉන්ධන මිල ඉහළ යෑම හේතුවෙන් මෙම අධිභාරය ඉවත් කර තිබූ බැවින් ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල මඟින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත 2022 ජුනි 15 දින වන විට ගෙවීමට ඇති රු.25,565,718,758 ක් ගෙවීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. තවද, 2021පෙබරවාරි 20 දින සිට ලීටරයකට අයකළ යුතු මෙම අධිභාරය ශූන්‍ය කර තිබුණි. ඒ අනුව මෙම මුදල පියවීම සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් උදා වී තිබුණි. | ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අනුව කටයුතු කරනු ලැබේ. | අරමුදලේ වගකීම් විධිමත්ව පියවිය යුතු වීම. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල මඟින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ගෙවීමට ඇති රු.26,673,196,758 ක් වුවද, එම අගයට අදාළ භාණ්ඩාගාර බිල්පත්වල මුහුණත වටිනාකම රු.29,200,746,758 ක් වීම හේතුවෙන් ඒ අතර වෙනස වූ රු.2,527,550,000 ක් පියවා ගැනීම සඳහා 2022 මැයි 31 දින වන විටත් පැහැදිලි ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබුණි . | -එම- | -එම- |
| (ඇ) | 2020 මාර්තු 31 දින අග්‍රාමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබුණු අංක 20/0684/204/060 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලෙහි සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ප්‍රසිද්ධ කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි . | එකඟ වෙමි. | අමාත්‍ය මණ්ඩලය තීරණය ප්‍රකාරව තොරතුරු වාර්තා කළ යුතුවීම. |
| (ඈ) | 2021 ජනවාරි 18 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළැඹි තීරණයකට අනුව ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල ශක්තිමත් කිරීම සඳහා රුපියල් බිලියන 48 ක අරමුදල් මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කිරීම පිණිස අවශ්‍ය පියවර ගන්නා ලෙස භාණ්ඩාගාරයේ ලේකම් වෙත නියෝග කර තිබුණද, 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි. | වර්තමානය වන විට රට තුළ පැන නැගී ඇති ආර්ථික අර්බුදය හේතුවෙන් මෙතෙක් රු. බිලියන 48 ක මුදල නිදහස් කිරීම සිදු කර නොමැත. | අමාත්‍ය මණ්ඩලය තීරණය ප්‍රකාරව අරමුදල ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුවීම. |